## III

අපි, අපගේ ''වාම'' කොමියුනිස්ට්වාදීන්ට ස්වදේශ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයෙහිදී අත් වී තිබෙන අභාග්‍යය වෙත හැරෙමු. වර්තමාන තත්වය ගැන වූ ප්‍රවාදවල එන පහත සඳහන් වාක්‍ය කොටස කියවන විට සිනහ නොවී සිටීම දුෂ්කරය.

''... ඉතිරි නිෂ්පාදන මාධ්‍යයන්ගෙන් ක්‍රමානුකූල ලෙස ප්‍රයෝජන ගැනීම ගැන සිතන්නට හැක්කේ ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළහොත් පමණකි''... ''ධනපති පංතියට සහ එහි සුළු ධනපති බුද්ධිවාදී පරිවර්තයන්ට යටත් නොවී ධනපති පංතිය අන්ත පරාජයට පත්කර කඩා කප්පල් කිරීම සම්පූර්ණයෙන්ම මර්දනය කිරීමට...''

ප්‍රිය මනාප ''වාම කොමියුනිස්ට්වාදීන්'' කොතරම් අධිෂ්ඨාන සහගත වුවත් ඔවුන් පෙන්නුම් කරන කල්පනාකාරිත්වය ඉතාමත් ඉල්පය. ''ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්'' අනුගමනය කිරීම යනුවෙන් ඔවුන් අදහස් කරන්නේ කුමක්ද?

ජනසතු කිරීම, නැතහොත්, රාජ්‍ය සන්තක කිරීම පිළිබඳ ප්‍රශ්නයේදී, අයෙකුට අධිෂ්ඨාන සහහත වීමට හෝ නොවීමට හෝ හැකිය. නමුත් වැදගත් කාරණය වන්නේ ජනසතු කිරීමේ සහ රාජ්‍ය සන්තක කිරීමේ සිට සමාජ සන්තක කිරීම වෙත යාමට, ඇතිකර ගත හැකි විශාලතම ''අධිෂ්ඨානය'' වුවද ප්‍රමාණවත් නොවන බවය. අපගේ ''වාම'' වාදීන්ගේ අභාග්‍යය වන්නේ, ''ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්'' යන වචන බොළඳ හා ලාමක ලෙස එකට තැබීමෙන් ප්‍රශ්නයේ අරටු කොටස, එනම්, ''වර්තමාන'' තත්වයේ හරය වටහා ගැනීමට ඇති ඔවුන්ගේ අන්ත අසමර්ථතාවය හෙළිදරව් කිරීමය. අපගේ ''වාම'' වාදීන්ගේ අභාග්‍යය වන්නේ, ''වර්තමාන තත්වයේ'', එනම්, රාජ්‍ය සන්තක කිරීමේ (එය ක්‍රියාත්මක කිරීම සඳහා අන් සියල්ලටම වඩා දේශපාලනඥයෙකුගේ අධිෂ්ඨානය අවශ්‍ය වේ) සිට සමාජ සන්තක කිරීම (එය ක්‍රියාත්මක කිරීම සඳහා විප්ලවවාදියෙකුට වෙනත් ගතිගුණ අවශ්‍යය) දක්වා යාමේ මුළු සාරාර්ථයම ඔවුන්ට මගහැරී යාමය.

ඊයේ දින ව්‍යාපාරයේ ප්‍රධාන කර්තව්‍යය වූයේ හැකි තරම් අධිෂ්ඨාන

සහගත ලෙස ජනසතු කිරීම, රාජ්‍ය සන්තක කිරීම, ධනපති පංතිය තලා දැමීම හා පොඩිපට්ටම් කර දැමීම සහ කඩා කප්පල් කිරීම මර්දනය කිරීම විය. අපට තක්සේරු කිරීමට පවා කාලයක් නොමැති වන තරමට අප ජනසතුකර, රාජ්‍ය සන්තක කර, තලා දමා සහ පොඩි පට්ටම් කර දමා තිබෙන බව අද නොපෙනෙනු ඇත්තේ අන්ධයෙකුට පමණකි. සරල රාජ්‍ය සන්තක කිරීම සහ සමාජ සන්තක කිරීම අතර ඇති වෙනස නම්, ගණන් බැලීමේ සහ නිසි ලෙස බෙද හැරීමේ හැකියාව නොමැතිව, ''අධිෂ්ඨානයෙන්'' පමණක් රාජ්‍ය සන්තක කිරීම ක්‍රියාත්මක කළහැකි නමුත්, එම හැකියාව නොමැතිව සමාජ සන්තක කිරීම ක්‍රියාත්මක කළ නොහැකි වීමය.

ඊයේ දින අප ඉටු කළේ රාජ්‍ය සන්තක කිරීමේ දී, ධනපති පංතිය තලා දැමීමෙහි දී සහ කඩා කප්පල් කිරීම මර්දනය කිරීමේ දී අධිෂ්ඨානය දැක්වීමේ ඓතිහාසික සේවය ය (හෙටද අපි එය ඉටු කරන්නෙමු). අද ''වර්තමාන තත්වය ගැන ප්‍රවාද'' වල මේ ගැන ලිවීම යනු අයෙකුගේ බැල්ම අතීතය වෙත සවි කරගෙන සිටිමින්, අනාගතයට පරිවර්තනය වීම ගැන අවබෝධ කර ගැනීමට අසමත්කම දැක්වීම වේ.

''... කඩා කප්පල් කිරීම සම්පූර්ණයෙන්ම මර්දනය කිරීම...'' ඔවුන් සොයාගෙන තිබෙන කර්තව්‍යයක මහිමය! අපගේ කඩාකප්පල් කාරයන් හොඳටම සෑහෙන තරමට ''මර්දනය කර'' ඇත. අපට අඩුව ඇත්තේ ඊට හාත්පසින්ම වෙනස් දෙයකි. අපට අඩුව ඇත්තේ, කුමණ කඩාකප්පල් කාරයන් වැඩට යෙදිය යුතුද, ඒ කුමණ කන්හිද යන්න හරිහැටි තක්සේරු කිරීමය. නිදසුනක් ලෙසට, දැන් අපගේ සේවයට බැඳෙමින් සිටින කඩා කප්පල් කාරයන් සියයක් දෙනෙකු පාලනය කිරීමේ හැකියාව එක බොල්ෂෙවික් නායකයෙකුට හෝ පාලකයෙකුට ගෙන දෙන පරිදි අපගේම බලවේගයන් සංවිධානය කිරීමය. පවතින තත්වය එසේ වූ කල. ''ඉතාමත් අධිෂ්ඨාන සහගත සමාජ සන්තක කිරීමේ ප්‍රතිපත්තියක්'', ''අන්ත පරාජයට පත්කර'' සහ ''සම්පූර්ණයෙන්ම වර්ධනය කිරීමට'' යන වදන් කියා පෑම යනු හුදෙක්ම ඉලක්කය වරද්ද ගැනීමකි. අන්ත පරාජයට පත් කිරීම, මර්දනය කිරීම ආදිය සමාජවාදය ගෙන ඒම සඳහා ප්‍රමාණවත් නොවන බව වටහා ගැනීමේ නොහැකියාව සුළු ධනපති පංතික විප්ලවවාදියාට ආවේණික ලක්ෂණයකි. ලොකු දේපල හිමියෙකුට විරුද්ධව සරොස්වූ සුළු දේපල හිමියෙකුට එය ප්‍රමාණවත් විය හැකිය. නමුත්, නිර්ධන පංති විප්ලවවාදියෙක් කිසිකලෙකත් එම වරදට නොවැටෙන්නේය.

අප උපුටා දැක්වූ වචන සිනහවක් මතු කිරීමට හේතු වී නම්. ''වාම කොමියුනිස්ට්වාදීන්'' ගේ පහත සඳහන් සොයා ගැනීම නිසා මතුවනු ඇත්තේ කොක් හඬ ලෑමකි. ඔවුන්ගේ මතය අනුව ''දකුණට නැඹුරු

වූ බොල්ෂෙවික් අපගමනය'' යටතේ සෝවියට් සමූහාණ්ඩුව ''රාජ්‍ය ධනපති ක්‍රමය දෙසට'' පරිනාම වීමේ තර්ජනය මතුවී තිබේ. මේපාර නම් ඔවුන් අපව හොඳටම බිය ගන්වා ඇත!'' ''වාම කොමියුනිස්ට්වාදීන්, ඔවුන්ගේ ප්‍රවාදවලින් සහ ලිපිවලින් මෙම තර්ජනාත්මක හෙළිදරව්ව යළිත් ප්‍රතිරාවය දෙවන්නේ මොන තරම් ජවයක් සහිතවද?

අපගේ සෝවියට් සමූහාණ්ඩුවේ දැන් පවතින තත්වය හා සමග සසඳන කල රාජ්‍ය ධනපති ක්‍රමය ඉදිරි පියවරක් වනු ඇති බව ඔවුන්ට කල්පනා වී නැත. සය මසක් පමණ කාලයකින් අපගේ සමූහාණ්ඩුව තුළ රාජ්‍ය ධනපති ක්‍රමය ස්ථාපිත වේ නම් එය විශාල ජයග්‍රහණයක් වනු ඇත. එවිට, අවුරුද්දක් ඇතුලත සමාජවාදය තදින් මුල් අල්ලන බවට හා එය අප රටේ අනභිභවනීයත්වයට පත්වන බවට එම රාජ්‍ය ධනපති ක්‍රමය සහතිකයක් වනු ඇත.

''වාම කොමියුනිස්ට්වාදියා'' මෙම වචන වලින් ඉවතට හැරෙනු ඇත්තේ මොන තරම් උත්තම උදහසකින්ද යනුත්, ''දකුණට යොමු වූ බොල්ෂෙවික් අපගමනයට'' විරුද්ධව ඔහු කම්කරුවන් අමතා කරනු ඇත්තේ මොන තරම් නිෂේධකාරී විවේචනයක් ද යනුත්, මට සිතා ගත හැකිය. හැබෑට ම? සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව තුළ රාජ්‍ය ධනපති ක්‍රමය දිසාව බලා කෙරෙන පරිවර්තනය ඉදිරි පියවරක් වනු ඇත? ... මෙය සමාජවාදයට ද්‍රෝහී වීමක් නොවේද?

මෙහිදී, අපි ''වාම කොමියුනිස්ට්වාදීන්ගේ ආර්ථික දෝෂයේ මූල වෙත එළඹෙන්නෙමු. මෙම කරුණ ගැන වඩාත් විස්තර සහිතව විමසිය යුත්තේ එහෙයිනි.

ප්‍රථමයෙන්ම, අප රට සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව යනුවෙන් හැඳින් වීමට අපට අයිතියක් ලැබෙන්නේ සහ හේතු සාධක වන්නේ ධනපති ක්‍රමයේ සිට සමාජවාදය දක්වා සිදුවන කුමණ පරිවර්තනයක් නිසාද යනු ''වාම කොමියුනිස්ට්වාදීන්ට'' වැටහෙන්නේ නැත.

දෙවැනිව, අප රටේ සමාජවාදයට ප්‍රධාන සතුරා වන්නේ සුළු ධනපති ගති ලක්ෂණය බව නොපිළි ගැනීම නිසාම ඔවුහු ඔවුන්ගේ සුළු ධනපති චිත්ත ස්වභාවය හෙළිදරව් කරති.

තුන්වැනිව, සෝවියට් රාජ්‍යය ආර්ථික වශයෙන් ධනපති රාජ්‍යයට වඩා වෙනස් බව වටහා ගැනීමට ඔවුන්ගේ ඇති අසමර්ථතාවය ''රාජ්‍ය ධනපති ක්‍රමය'' ගැන ඔවුන් දක්වන බලවත් බිය අනුව හෙළිදරව්වේ.

අපි මෙම කරුණු තුන පරීක්ෂා කර බලමු.

රුසියාවේ ආර්ථික ක්‍රමය ගැන අධ්‍යයනය කිරීමේදී එහි පරිවර්තනීය ස්වභාවය නොපිළිගෙන ප්‍රතික්ෂේප කළ කෙනෙක් නැතැයි මම අදහස් කරමි. එසේම සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව යන පාඨයෙන් අදහස්

වන්නේ සමාජවාදය කරා පරිවර්තනය වීමට සෝවියට් බලයේ ඇති අධිෂ්ඨානය මිස පවතින නව ආර්ථික ක්‍රමය සමාජවාදය ලෙස පිළිගැනීමක් නොවන බව කිසිප කොමියුනිස්ට්වාදියෙක් ප්‍රතික්ෂේප කර නැතැයි ද සිතමි.

නමුත් මෙම ''පරිවර්තනය'' යන වචනයේ අර්ථය කුමක් ද? ආර්ථිකයට ගලපන ලද කල මෙයින් අදහස් කෙරෙන්නේ ධනපති ක්‍රමය සහ සමාජවාදය යන දෙකෙහිම ගති ලක්ෂණ, අංශු හෝ කැබලි වර්තමාන ක්‍රමයෙහි තිබෙන බවක් ද? ඒ එසේය යන්න ගැන කවුරුත් එකඟ වනු ඇත. නමුත්, වර්තමාන අවස්ථාවේ රුසියාවේ පවතින විවිධ සමාජ-ආර්ථික ව්‍යුහයන් ඇත්ත වශයෙන් ම සමන්විතවන්නේ කුමණ මූලිකාංගයන්ගෙන්ද යන්න ගැන සලකා බැලීමට තරම් කරදර වන්නේ ඉහත කරුණ පිළිගන්නා සැම කෙනෙක්ම නොවේ.

අපි මෙම මූලිකාංගයන් නම් කරන්නෙමු:

1) පිතෘ මූලික, එනම්, බොහෝ දුරට, ස්වාභාවික ගොවිජන ගොවි තැන;

2) කුඩා පරිමාණ වෙළඳ භාණ්ඩ නිෂ්පාදනය (තමන්ගේ ධාන්‍ය විකුණන ගොවි ජනයා බොහෝ දෙනෙක් මෙයට ඇතුලත්ය);

3) පෞද්ගලික ධනපති ක්‍රමය;

4) රාජ්‍ය ධනපති ක්‍රමය;

5) සමාජවාදය.

රුසියාව කොතරම් විශාලද හා විවිධ ද යත්, මෙම නොයෙක් වර්ගයේ සමාජ ආර්ථික ව්‍යුහයන් සියල්ලම එකට පැටලී පවතී. වර්තමාන තත්වයේ විශේෂ අංගලක්ෂණය සැදෙන්නේ එයිනි.

මෙම ප්‍රශ්නය පැන නගින්නේය: ප්‍රබලවන්නේ කුමණ මූලිකාංගයන් ද? කුඩා ගොවිජන රටක, ඉඩම් ගොවිතැන් කරන අතිබහුතරයක් ජනකාය සුළු වෙළඳ භාණ්ඩ නිෂ්පාදකයන් වන නිසා, සුළු ධනපති මූලිකාංගය ප්‍රබල වන්නේය, එය ප්‍රබල විය යුතුය. අපගේ රාජ්‍ය ධනපති ක්‍රමයේ (ධාන්‍ය ඒකාධිකාරය, රජයෙන් පාලනය කෙරෙන ව්‍යවසායිකයන් හා වෙළෙන්දන්, ධනපති සමූපකාරකයන්) කවුච වරෙක එක තැනකින් සහ තවත් වරෙක තවත් තැනකින් ලාභ ගරන්නන් විසින් සිදුරු කරනු ලැබේ. ලාභ ගැරීමේ ප්‍රධාන භාණ්ඩය වී තිබෙන්නේ ධාන්‍ය ය.

ප්‍රධාන අරගලය කරනු ලබන්නේ මෙම ක්ෂේත්‍රයෙහිය. ''රාජ්‍ය ධනපති ක්‍රමය'' වැනි ආර්ථික ප්‍රවර්ගයන් ගැන කථා කරන්නෙමු නම් මෙම අරගලය සිදුවන්නේ කුමණ මූලිකාංගයන් අතර ද? එම අරගලය සිදුවන්නේ මා ඒවා නම් කර ඇති පිළිවෙළ අනුව හතරවැනි සහ පස්වැනි මූලිකාංගයන් අතරද? ඇත්තෙන්ම නැත. සමාජවාදයට විරුද්ධව යුද්ධ

ප්‍රකාශ කර තිබෙන්නේ රාජ්‍ය ධනපති ක්‍රමය නොවේ. එසේ කර තිබෙන්නේ රාජ්‍ය ධනපති ක්‍රමයටත්, සමාජවාදයටත් යන දෙකටම විරුද්ධව එක්ව සටන් කරන සුළු ධනපති සහ පුද්ගලික ධනපති ක්‍රමය ය. රාජ්‍ය ධනපති ක්‍රමයේ වේවා. රාජ්‍ය සමාජවාදී ක්‍රමයේ වේවා, සෑම වර්ගයකම රාජ්‍ය ඇහිලි ගැසීමකට, ගිණුම් තැබීමකට හා පාලනයකට සුළු ධනපති පංතිය විරුද්ධ වන්නේය. මෙය කිසිසේත් නැතැයි කිව නොහැකි යථාර්ථ කරුණකි. ''වාම කොමියුනිස්ට්වාදීන්ගේ'' ආර්ථික දෝෂයට මුල, ඔවුන් මෙය වටහා නොගැනීමය. අපගේ ප්‍රධාන ''අභ්‍යන්තර'' සතුරන් වන්නේ, සෝවියට් බලයේ ආර්ථික පියවරයන්ගේ සතුරන් වන්නේ ලාභ ගරන්නා, වාණිජ වංචාකාරයා සහ ඒකාධිකාරය කඩා කප්පල් කරන්නා යන මොවුන්ය. ''තෝරාගත්'' කීප දෙනෙකු මරා දැමීමෙන් සහ ගිගුරුම් හඬ දෙමින් කළ වතුර කථා මගින් ලාභ ගරන්නා මර්දනය කිරීමට එක සිය විසිපස් වසරකට පෙර ප්‍රයත්න දැරූ ඉතාමත් භක්තිමත් සහ අවංක විප්ලවවාදීන් වූ ප්‍රංශ සුළු ධනපතියන්ට සතුට දිය හැකි වන්නට තිබුණි. එසේ වුවත්, අද, මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් සමහර වාම සමාජවාදී-විප්ලවවාදීන් දක්වන වතුර කථා පැවැත්වීමේ ආකල්පය නිසා, දේශපාලන විඥනය ඇති සෑම විප්ලවවාදියෙකුම තුළ පැන නගිනු ඇත්තේ අප්‍රසාදය හා පිළිකුල මිස අන් කිසිවක් නොවේ. ලාභ ගැරීමේ අර්ථික පදනම වන්නේ රුසියාවේ සෑම තන්හිම බහුල වශයෙන් පැතිරී සිටින සුළු දේපල හිමියන් සහ සෑම සුළු ධනපතියෙක්ම ඒජන්තවරයෙක් කොටගත් පුද්ගලික ධනපති ක්‍රමය යන දෙකොටසම බව අපි ඉතා හොඳින් දනිමු. මෙම සුළු ධනපති බූවල්ලා උගේ දශලක්ෂ සංඛ්‍යාත අඩුවලින් වටින් වර කම්කරු කොටස් වට කර ගනු ලබන බවත්, රාජ්‍ය ඒකාධිකාරය වෙනුවට, ලාභ ගැරීම අපගේ සමාජ හා ආර්ථික ජීවේන්ද්‍රියෙහි සෑම සිදුරක්ම තුළට කාවදින බවත් අපි දන්නෙමු.

මෙය නොදක්නාවුන් සුළු ධනපති පූර්ව මතයේ වහලුන් වී සිටින බව ඔවුන්ගේ මෙම අන්ධ කමෙන් පෙනේ. අපගේ ''වාම කොමියුනිස්ට්වරු'' ද වැටී සිටින්නේ මෙම තත්වයටමය. ඔවුන් වචනයෙන් (හා ගැඹුරුතම විශ්වාසය අනුව) සුළු ධනපති පංතියේ නිරනුකම්පික සතුරන් වන අතර ක්‍රියාවෙන් සුළු ධනපතියන්ට ම පමණක් ආධාර කරති. එසේම ජනගහනයේ මෙම කොටසට පමණක් සේවය කරති. 1918 අප්‍රේල් මාසයේදී!! ''රාජ්‍ය ධනපති'' ක්‍රමයට විරුද්ධව සටන් කිරීමෙන්ද ඔවුන් ප්‍රකාශ කරන්නේ එම ජනකොටසේම අදහස පමණකි. ඔවුහු ඉලක්කය අසලකටවත් ළං නොවෙති!

යුද්ධ කාලය තුළදී ''අවංක'' හා විශේෂයෙන්ම වංක මාර්ගයෙන් සුළු ධනපතියෝ දෙතුන් දහසින් මුදලක් ඉතිරි කරගෙන සිටිති. ඔවුහු ලාභ

ගරන සහ පෞද්ගලික ධනපති ක්‍රමයේ පදනම වශයෙන් ප්‍රයෝජනවත් වන ආර්ථික ප්‍රවර්ගයේ ලක්ෂණ ඇති පිරිසක් වෙති. මුදල යනු එය හිමියාට සමාජ වස්තුව ලබා ගැනීමට අයිතිය දෙන සහතිකයකි. කෝටි සංඛ්‍යාත සුළුදේපල හිමියෝ මෙම සහතිකය කෙරෙහි එල්බ ගෙන එය ''රාජ්‍යයෙන්'' වසං කරති. සමාජවාදය හෝ කොමියුනිස්ට් ක්‍රමය ගැන විශ්වාසයක් නොතබන ඔවුහු නිර්ධන පංති කුණාටුව හමායන තෙක් කල් බලති. එක්කෝ අපි සුළු ධනපතියන් අපගේ ගිණුම් තැබීමට සහ පාලනයට යටත් කළ යුත්තෙමු (දේශපාලන විඥානය ඇති නිර්ධන පංතිය වටා ජනගහනයෙන් බහුතරය, නැතහොත් අර්ධ නිර්ධන පංතිකයන් සංවිධානය කරන්නෙමු නම්, අපට මෙය කළ හැකිය). එසේ නැතහොත්, මෙම සුළු දේපල හිමිකම නැමැති භූමියෙහිම පැනනැගුනු නැපෝලියන්ලා සහ කැවිග්නැක්ලා විසින් විප්ලවය පෙරළා දමන ලද මෙන්ම, ස්ථිරවම සහ අනිවාරණීය වශයෙන්ම, සුළු ධනපතියන් අපගේ කම්කරු බලය පෙරළා දමනු ඇත. ප්‍රශ්නය හා සම්බන්ධයෙන් දැන් පවතින තත්වය එසේය. මෙම සරල සහ පැහැදිලි සත්‍යය නොපෙනෙන්නේ වාම සමාජවාදී-විප්ලවවාදීන්ට පමණකි. ''වෙහෙසෙන'' ගොවි ජනයා ගැන ඔවුන් දොඩන හිස් වදන් පිළිබඳ මීහිදුම නිසා ඔවුන්ට එම සත්‍යය නොපෙනේ. නමුත් මෙම වාම සමාජවාදී-විප්ලවවාදීන් ගැන බරපතල ලෙස ගණන් ගන්නෝ කවරහුද?

තමන්ගේ දහස් ගණනක මුදල රැස්කර තබා ගන්නා සුළු ධනපතියා රාජ්‍ය ධනපති ක්‍රමයේ සතුරෙකි. ඔහුට අවශ්‍ය වී තිබෙන්නේ තමන්ම සඳහා, දුප්පතුන්ට විරුද්ධව, මොනම වර්ගයක හෝ රාජ්‍ය පාලනයට විරුද්ධව තමන්ගේ දහස් ගණනක මුදල යෙදීමටය. එසේම මෙම දහස් ගණන්වල මුළු එකතුවෙන් සැදෙන කෝටි සිය ගණනක මුදල අපගේ සමාජවාදය ගොඩ නැගීමේ කටයුතු දුර්වල කරන ලාභ ගැරීමේ පදනම වන්නේය. කිසියම් කම්කරුවන් සංඛ්‍යාවක්, දින කිපයක් තුළදී 1000 ක වටිනාකම් නිපදවතියි සිතමු. සුළු ලාභ ගැනීම සහ විවිධාකාර වංචා නිසා ද, සුළු දේපල හිමියන් සෝවියට් ආඥා සහ රෙගුලාසි මග හැරීම් නිසාද, මෙම 1000 න් 200 ක් අතුරුදහන් වෙතැයි ද සිතමු. 1000 න් 300 ක් වැය කර වඩාත් හොඳ සංවිධානයක් ඇති කර ගත හැකි නම්, 200 වෙනුවට තමන් කැමැත්තෙන්ම 300 ක් දෙන බව දේශපාලන විඥානය ඇති සෑම කම්කරුවෙක්ම කියනු ඇත. මක් නිසාද යත්, පසුව, ක්‍රමානුකූලතාවය සහ සංවිධානය තහවුරු කළ පසු, සුළු ධනපතියන් විසින් රාජ්‍ය ඒකාධිකාරය කඩාකප්පල් කරනු ලැබීම පරාජය කළ පසු, මෙම ''කප්පම'' 100 ක් හෝ 50 ක් දක්වා අඩු කිරීම අපහසු නොවන හෙයිනි.

සම්පූර්ණ පැහැදිලිතාවය තකා, මා උවමනාවෙන්ම අන්තය දක්වා සරල කළ මෙම සංඛ්‍යාමය නිදර්ශනයෙන් රාජ්‍ය ධනපති ක්‍රමය සහ සමාජවාදය අතර වර්තමාන සහසම්බන්ධය පැහැදිලි වේ. කම්කරුවන්ට රාජ්‍ය බලය හිමිව තිබෙන නිසා සමාජවාදී අරමුණු සඳහා හැර වෙනත් කිසිවක් සඳහා කොපෙක් එකක් හෝ නොදී මුළු දහසම ගැනීමේ සෑම නීතිමය අවස්ථාවක්ම ඔවුනට ඇත. ඇත්ත වශයෙන්ම බලය කම්කරුවන් අතට පත්වීම මත රැඳී පවතින මෙම නීතිමය අවකාශය සමාජවාදයේ මූලිකාංගයකි.

නමුත්, සුළු දේපල හිමි සහ පෞද්ගලික ධනපති ගති ලක්ෂණය නොයෙක් ආකාරයෙන් මෙම නීතිමය අවකාශය දුර්වල කරයි; ලාභ ගැරීම වැද්ද ගනියි; සෝවියට් ආඥවන් ක්‍රියාත්මක කිරීමට බාධා කරයි. එනිසා අප දැන් ගෙවනවාට වැඩිය ගෙව්වත්, රාජ්‍ය ධනපති ක්‍රමය යෝධ ඉදිරි පියවරක් වනු ඇත. (මා සංඛ්‍යාමය නිදසුනක් ගත්තේ කරුණ හොඳින් පැහැදිලි කරනු පිණිසය). එසේ කියන්නේ, ''අධ්‍යාපනය'' ලැබීම කම්කරුවන්ට ප්‍රයෝජනවත් නිසා ඒ සඳහා ගාස්තු ගෙවීම පාඩුවක් නොවන හෙයිනි; අපිළිවෙළ, ආර්ථික විනාශය සහ නොසැලකිල්ල පරදවා ලබන ජයග්‍රහණය ඉතාමත් වැදගත් දෙය වන හෙයිනි; රාජ්‍ය ධනපති ක්‍රමයට වඩාත් බරපතල කප්පමක් ගෙවූවත් එයින් අප විනාශයට පත් නොවන හා ඉතාමත් විශ්වාසදයක මාර්ගය ඔස්සේ අපට සමාජවාදය කරා යාමට හැකි වන අතර, සුළු දේපලහිමි ක්‍රමයේ අරාජිකත්වය තවදුරටත් පැවැතීම ඉතාමත් විශාල හා බරපතල අන්තරායක් හා (එය පරාජය නොකළ හොත්) අපගේ ඒකාන්ත විනාශයද වන හෙයිනි. සුළු දේපල හිමි කණ්ඩ අරාජිකත්වයට විරුද්ධව රාජ්‍ය යන්ත්‍රය ආරක්ෂා කරන හැටි කම්කරු පංතිය උගෙන ගත් පසු, ජාතික පරිමාණයෙන් හා රාජ්‍ය ධනපති ක්‍රියාමාර්ග අනුව මහා පරිමාණ නිෂ්පාදනය සංවිධානය කිරීමට එය උගෙන ගත් පසු එයට — මෙම වචනය යෙදීම මනා නම් — තුරුම්පු සියල්ලම අත් වීමත්, සමාජවාදය තහවුරුවීමත් සහතික වනු ඇත.

ප්‍රථම කොටම, රාජ්‍ය ධනපති ක්‍රමය ආර්ථික වශයෙන් දැන් පවතින අපගේ ආර්ථික ක්‍රමයට වඩා අපරිමිත තරමින් උසස්ය.

දෙවැනිව, සෝවියට් රාජ්‍යය යනු කම්කරුවන්ගේ සහ දුප්පතුන්ගේ බලය සහතික වූ රාජ්‍යයක් වන හෙයින්, සෝවියට් බලයට එයින් වන භයානක අන්තරායක්ද නැත. මෙම අවිවාදී සත්‍යයන් වටහා ගැනීමට ''වාම කොමියුනිස්ටවාදීහු'' අසමත් වූහ. සාමාන්‍ය වශයෙන්ම දේශපාලන අර්ථශාස්ත්‍රය පිළිබඳ අදහස් තම හිස තුළ ඒකාබද්ධ කර ගත නොහැකි ''වාම සමාජවාදී-විප්ලවවාදීන්ට'' මෙම සත්‍යයන් කිසි කලෙකත් වටහා ගත නොහැකි වනු ඇත. නමුත් සෑම මාක්ස්වාදියෙක්ම ඒවා පිළිගත

යුත්තේය. වාම සමාජවාදී-විප්ලවවාදියෙක් සමග තර්ක කිරීම වුවද වැදගත් නොවන්නේ ය, හුළං මල්ලක් පිළිබඳ ''පිළිකුල් සහගත නිදර්ශනයක්'' දෙසට ඔහු ඇඟිල්ල දික්කර පෙන්නුම් කිරීම ප්‍රමාණවත්ය. නමුත් ''වාම කොමියුනිස්ට්වාදීන්'' සමග තර්ක කළ යුතුය. ඒ එහිදී වරද කරන්නේ මාක්ස්වාදීන් වන නිසා සහ ඔවුන්ගේ වරද විග්‍රහ කිරීම කම්කරු පංතියේ නියම මග සොයා ගැනීමට එයට ආධාරයක් වන නිසාය.